# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

**10 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය - 2016**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

## ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (2) | 21 | (2) |
| 02 | (3) | 22 | (4) |
| 03 | (4) | 23 | (3) |
| 04 | (3) | 24 | (1) |
| 05 | (2) | 25 | (1) |
| 06 | (2) | 26 | (3) |
| 07 | (1) | 27 | (2) |
| 08 | (3) | 28 | (4) |
| 09 | (4) | 29 | (1) |
| 10 | (4) | 30 | (2) |
| 11 | (1) | 31 | (3) |
| 12 | (4) | 32 | (4) |
| 13 | (3) | 33 | (2) |
| 14 | (3) | 34 | (1) |
| 15 | (2) | 35 | (4) |
| 16 | (2) | 36 | (3) |
| 17 | (3) | 37 | (2) |
| 18 | (4) | 38 | (3) |
| 19 | (2) | 39 | (2) |
| 20 | (1) | 40 | (1) |

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) (අ) ලාභ අරමුණ

(ආ) හවුල් ව්‍යාපාර

(ii) වාසි :

1. වැඩි ප්‍රාග්ධනයක් සපයා ගත හැකි වීම (කේවල ස්වාමි ව්‍යාපාරවලට සාපේක්ෂ ව)
2. වගකීම බෙදී යාම
3. හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම
4. සාමූහික තීරණ ගත හැකි වීම

අවාසි :

1. අසීමිත වගකීම
2. ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
4. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම

(iii) රූපලාවන්‍ය පාඨමාලාවක් හදාරා තිබීම, මූල්‍ය ශක්තිය, ව්‍යාපාර නාමය ජනප්‍රිය වීම

(iv) ඔව්

අයිතිකරුවන්ගේ නම්වලින් පවත්වාගෙන නොයන නිසා

(v)

| වත්කම් | | = | හිමිකම |
|---|---|---|---|
| රු. | | | රු. |
| 150 000 + | 100 000 | | 250 000 |
| මුදල් | රූපලාවන්‍ය උපකරණ | | ප්‍රාග්ධනය |

250 000

(vi) ගොඩනැගිලි කුළී, විදුලි වියදම්, ගැණුම්

(vii) මුදල් පොත, බැංකු ගිණුම

(viii) රු. 78 000

(ix) **බැංකු ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015.01.03 | මුදල් | 50 000 | 2015.01.14 | විදුලි වියදම් | 2 300 |
| 2015.01.10 | මුදල් | 10 000 | | ශේෂය ප/ගෙ | 57 700 |
| | | 60 000 | | | 60 000 |
| 2015.01.15 | ශේෂය ඉ/ගෙ | 57 700 | | | |

(x) රු. 39 500

**(ලකුණු 2 x 10 = 20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට අදාළ ඕනෑම ආර්ථික කටයුත්තකි.

(ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.)

(ii)

| | **අවශ්‍යතා** | | **වුවමනා** |
|---|---|---|---|
| 1 | අත්‍යවශ්‍ය වීම | 1 | අත්‍යවශ්‍ය නොවීම |
| 2 | පොදු වීම | 2 | විවිධ වීම |
| 3 | සීමිත වීම | 3 | අසීමිත වීම |
| 4 | නිර්මාණය කළ නොහැක | 4 | නිර්මාණය කළ හැක |
| 5 | සරල වීම | 5 | සංකීර්ණ වීම |

(iii) (අ) සත්‍ය

(ආ) අසත්‍ය

(ඉ) අසත්‍ය

(ඊ) සත්‍ය

(iv) 1. බදු ආදායම් ලබාගැනීම

2. රැකියා අවස්ථා උත්පාදනය

3. ජාතික නිෂ්පාදිතය වර්ධනය

**(ලකුණු 2 x 4 = 8)**

03. (i)

- ව්‍යාපාර පරිසරය
  - අභ්‍යන්තර පරිසරය
    - අයිතිකරුවෝ
    - කළමනාකරුවෝ
    - සේවකයෝ
  - බාහිර පරිසරය
    - ගනුදෙනුකරුවෝ
    - සැපයුම්කරුවෝ
    - තරඟකරුවෝ
    - දේශපාලන පරිසරය
    - නෛතික පරිසරය
    - තාක්ෂණික පරිසරය
    - ආර්ථික පරිසරය
    - ගෝලීය පරිසරය

(ii) එකඟ වේ.

ව්‍යාපාර පරිසරයෙන් ව්‍යාපාරයට ඇතිවන යහපත් හා අයහපත් බලපෑම් හඳුනාගැනීම සඳහා ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කළ යුතුය. (ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන)

(iii) අන්තර්ජාලය, රූපවාහිනිය, ගුවන් විදුලිය

(iv)
- ★ නවීන තාක්ෂණය ලබාගත හැකි වීම
- ★ ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම
- ★ කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි වීම
- ★ විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම
- ★ දේශීය භාණ්ඩ හා සේවා සඳහා විදේශ වෙළෙඳපොල ලබාගත හැකි වීම

04. (i)
1. ලාභය අයිතිකරු සතු වීම
2. ආරම්භ කිරීම පහසු වීම
3. ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම
4. තීරණ ගැනීමේ ස්වාධීන බව

(ii) සමාගමකට වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම නිසා වැඩි වැටුප් හා වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ සපයා උසස් මානව සම්පත් ලබාගත හැකි වීම

(iii) සෑම සාමාජිකයෙකුගේ ම ඡන්දයෙන් සමුපකාර සමිතියේ පාලන කටයුතු සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයක් තෝරාගැනීම හා බහුතරයේ කැමැත්ත මත තීරණ ගැනීම

| | | | | |
|---|---|---|---|---|
| (iv) | (අ) | සංස්ථාව | - | ගුවන් විදුලි සංස්ථාව, රූපවාහිනී සංස්ථාව |
| | (ආ) | අධිකාරිය | - | මධ්‍යම පරිසර අධිකාරිය, වරාය අධිකාරිය |
| | (ඉ) | කාර්යාංශය | - | විදේශ සේවා නියුක්ති කාර්යාංශය |
| | (ඊ) | රාජ්‍ය නීතිගත සංස්ථාව | - | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව |

**(ලකුණු 2 x 4 = 8)**

## II කොටස - ගිණුම්කරණය

05. (i) (අ) වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් **(ලකුණු 01)**

(ආ) ව්‍යාපාරයේ හිමිකරු ව්‍යාපාරය සතු මුදල්, භාණ්ඩ හෝ වෙනත් වත්කම් තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබාගැනීම **(ලකුණු 01)**

(ii)

| | වත්කම් | | | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | | රු. | | රු. |
| (අ) | මුදල් | + | 250 000 | = | ප්‍රාග්ධනය + 250 000 | + | - |
| (ආ) | භාණ්ඩ | + | 20 000 | = | - | | ණයහිමි + 20 000 |
| (ඇ) | ලී බඩු | + | 12 000 | = | - | + | - |
| | මුදල් | - | 12 000 | | | | |
| (ඈ) | මුදල් | + | 30 000 | = | - | | බැංකු ණය + 30 000 |
| (ඉ) | ණයගැති | + | 18 000 | | | | |
| | භාණ්ඩ | - | 15 000 | = | ලාභය + 3 000 | | - |
| (ඊ) | මුදල් | - | 2 000 | | ගැනිලි - 2 000 | | - |

**(ලකුණු 01 බැගින්)**

(iii)

| | | රු. | | රු. | |
|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධනය | 325 000 | | | |
| එකතු කළා : | අමතර ප්‍රාග්ධනය | 40 000 | ල. 02 | | |
| | ආදායම් | 200 000 | | 565 000 | |
| අඩු කළා : | ගැනිලි | 20 000 | ල. 01 | | |
| | වියදම් | 110 000 | | (130 000) | |
| | හිමිකම | | | 435 000 | ල. 01 |

06. (i) මූලික පොතක්, ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම

පැහැදිලි කිරීමට **(ලකුණු 02)**

(ii) මූලාශ්‍ර ලේඛනය — මූලික පොත

| | මූලාශ්‍ර ලේඛනය | මූලික පොත | | |
|---|---|---|---|---|
| (අ) | ගෙවීම් වවුචරය | මුදල් පොත | **ලකුණු 01** | **ලකුණු 03** |
| (ආ) | පිළිපත / බැංකු ප්‍රකාශනය | බැංකු ගිණුම | **ලකුණු 01** | |
| (ඉ) | ගැණුම් ඉන්වොයිසිය | ගැණුම් ජ'නලය | **ලකුණු 01** | |

(iii) **මුදල් පොත**

**ආකෘතියට ලකුණු 01**

**හර** **බැර**

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 05.01 | ශේෂය ඉ/ගෙ | | 75 000 | 05.03 | ගැණුම් | | 15 000 |
| 05.07 | බැංකු ණය | | 25 000 | 05.20 | විදුලි ගාස්තු | | 4 000 |
| 05.15 | විකුණුම් | | 2 500 | 05.27 | ණයහිමි | | 2 000 |
| 05.25 | ණයගැති | | 1 500 | 05.30 | බැංකු ණය | | 5 000 |
| | (**ළ 1/2 බැගින් ළ. 2**) | | | | (**ළ 1/2 බැගින් ළ. 2**) | | |
| | | | | 05.31 | ශේෂය ප/ගෙ **ළ 1** | | 78 000 |
| | | | 104 000 | **ළ 1/2** | | | 104 000 |
| 06.01 | ශේෂය ඉ/ගෙ **ළ 1/2** | | 78 000 | | | | |

**(ලකුණු 07)**

07. (i) (අ) බැංකුවේ අවසරය මත ජංගම ගිණුමේ පැවති මුදල් ප්‍රමාණයට වැඩි වටිනාකමකින් චෙක්පත් නිකුත් කිරීම

**(ලකුණු 01)**

(ආ) 1. චෙක්පත් අවිධිමත් ව ලියා තිබීම (නිසියාකාර ව ලියා නොතිබීම)

2. ජංගම ගිණුමේ මුදල් නොතිබීම

3. ගිණුම වසා තිබීම

4. අත්සන වෙනස්වීම

5. චෙක්පත බොඳ වී අපැහැදිලි වී තිබීම **(ලකුණු 1/2 බැගින් 02 කට ලකුණු 01)**

(ii) (අ)

**බැංකු ගිණුම (සංශෝධිත)**

| දිනය | විස්තරය | ස පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 06.30 | ශේෂය ඉ/ගෙ **ල. 1** | | 33 200 | | ස්ථාවර නියෝග | | 5 100 |
| | ණයගැති ප්‍රේෂණ | | 4 200 | | බැංකු ගාස්තු | | 300 |
| | ලාභාංශ | | 500 | | ශේෂය ප/ගෙ **ල. 1** | | 32 500 |
| | | | 37 900 | | | | 37 900 |
| 07.01 | ශේෂය ඉ/ගෙ | | 32 500 | | | | |

(ණයගැති ප්‍රේෂණ, ලාභාංශ: **ල 1/2 බැගින් ල. 1**; ස්ථාවර නියෝග, බැංකු ගාස්තු: **ල 1/2 බැගින් ල. 1**)

**(ලකුණු 04)**

(ආ)

**වසුදාගේ ව්‍යාපාරය** **ල. 1/2**

**2016.06.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | රු. | රු. | |
|---|---|---|---|
| 2016.06.30 දිනට සංශෝධිත බැංකු ශේෂය **ල. 1/2** | | 32 500 | **ල. 1** |
| **එකතු කළා :** | | | |
| නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | | | |
| චෙක් අංක 121421 **ල. 1/2** | 2 000 | | |
| චෙක් අංක 121422 **ල. 1/2** | 2 600 | | |
| | | 4 600 | |
| | | 37 100 | **ල. 1/2** |
| **අඩු කළා :** | | | |
| තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් **ල. 1/2** | 2 300 | | |
| | | (2 300) | **ල. 1/2** |
| 2016.06.30 දිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් ශේෂය **ල. 1/2** | | 34 800 | **ල. 1** |

**(ලකුණු 06)**

***